# ENOUGH OF CELEBRATIONS... LET US GET DOWN TO WORK...!

By the time this issue of the paper comes out in print, it would just be over three weeks since our valiant victory over the terrorists.

True it is a great occasion for us as it brought relief to everybody in Sri Lanka from over three decades of terror and consequential hardship. It had to be celebrated right royally in which everyone joined sincerely and voluntarily.

However, now we think that it is enough and the time has come to call a halt and get down to the unfinished tasks which call for attention and endeavour.

Still the most urgent is to bring relief to the large number of IDPs who are being looked after in the camps such as Menik Farm etc. While the military is engaged in the special tasks of de-mining and clearing up areas in the areas of Vanni, there is other work also to be done to provide the infrastructure, so that these people can move back safely to their original places as quickly as possible which is what they yearn for. This is also what we and the government want mostly. In the mean time there is much work to assist the valuable work being done at the moment by the social services, the voluntary organisations, patriotic NGOs, Sarvodaya etc. day and night to make life comfortable for these victims of Tiger Terrorism.

This requires much urgent work still such as maintaining medical attention and nursing, medical supplies, nutrition, food, clothing and day-to-day sanitation facilities and water specially. These are yet very important.



*There was an entertainment day held for the displaced children in Manik Farm Camp in Vavunia organised by Sri Lanka's Cinema and Drama artistes. Some of these children also took part in stage performances.*

We have to take an example from how our valiant soldiers worked without a break or even rest to reach victory. Let us dedicate ourselves to redouble our efforts at the above tasks. For if by any chance some infection were to start it would lead to severe problems in some of conditions of congestion still prevailing. It would also be a big blow to all our efforts so far. It would also provide opportunity for our enemies to shout out from rooftops.

Various observers, foreign and local have expressed opinions as to how long it will take to bring the Vanni to normalcy ranging from three years to over one year. Let us take all these as a challenge and put our shoulders together to bring back normalcy as soon as possible. For it is only on that date that this is achieved that we can rightly claim victory over the consequences of terrorism.

**V.R. ( Village Rustic )**
**Velegedera Raala**



Their own Tamil tiger brethren who lived with them claiming to be their saviours took them as hostages and human shield. As the fighting intensified between the Tigers and Govt. security forces, these people managed to flee the area still being shot at by the Tigers who threatened them not to leave. Sri Lanka Army and the Navy rescued them and gave them shelter, food and medical care and are still being well looked after..



## අවතැන්වූවන් තුන් ලක්ෂයක් බලාගැන්ම පහසු කාර්යයක් නොවේ!

ඔවුන් වරකට දාහ බැගින්ද, දෙදාහ බැගින්ද, තවත් දිනවල තුන් දහස බැගින්ද වැළ නොකැඩී එන්නට පටන්ගත්හ. කොටි මේ මිනිසුන් මිනිස් පළිහක් ලෙසට ගෙන ඔවුන් ප්‍රාණ ඇපකරුවන් ලෙසට තබාගෙන සිටියේ කොයි මොහොතක හෝ ජාත්‍යන්තර රටක් මැදිහත් වී ප්‍රභාකරන් ඇතුළු කොටිනායකයන් මුදාගෙන රැගෙන යාවිය යන විස්වාසය උඩය. එහෙත් ශ්‍රීලංකා සන්නද්ධ හමුදා කොටින් කිසිදු ඉඩක් නොදී, නායක ප්‍රභාකරන් ඇතුළු සියළුම කොටි රැළ මරා විනාශ කර දැම්මෝය. ඒ ග්‍රහණයේ සිටි සියළුම වැසියන්ද මුදා ගැනිණ.

එසේ මුදාගත් සියළුම දෙනාගේ එකතුව තුන් ලක්ෂයක් පමණ වන බව දැන් ගණන් බලා ඇත ඔවුන්ට කෑම බීම අඳින්ට වස්ත්‍ර වෛද්‍ය පහසුකම් පමණක් නොව දරුවන්ගේ අධ්‍යාපන පහසකම් සළසන්නටද රජයට දැන් සිදුව ඇත. ඒසඳහා යන වියදම සොයා ගන්නටද ශ්‍රීලංකා රජය දැන් ඉමහත් වෙහෙසක් ගනී. එසේම ඔවුනට ආරක්ෂාව සපයන්නටද සිදුව ඇත. කොටින්ට පක්ෂව සිටි ඇතැම් සිවිල් ජනයා කෙරෙහි කෝපයෙන් පසුවන දෙමළ ජනයාද ඒ කඳවුරුවල සිටිති. එසේම අනාථයින් ලෙස වෙස්වලා සිටින දරුණු කොටි සාමාජිකයන්ද මේ අතර සිටින බව පෙනී ගොස් ඇත ඒ සමහරෙකු දැනටම සොයා වෙන්කර තබා ඇත මේ සියළු දෙනා හැකි ඉක්මනින් ඔවුන්ගේ කලින් වාසස්ථාන වලට යැවීම රජයේ අරමුණයි.



## රතිඤ්ඤා පත්තුකෙරුවා කොඩි වැනුවා දැන් ඇති



කොහොම වත් අල්ලන්න බැරිය කිව්ව ප්‍රභාකරන්ට ශ්‍රීලංකා හමුදාවෙන් වෙඩි තියලා මරලයි කියන පුවත ශ්‍රී ලංකාවෙ රජයෙන් නිල වශයෙන් දැනුම් දුන්නා විතරයි, මුළු රටම එක පොදියට උඩ පැනලා හඬ නැගුවා. ජාතික කොඩි අරන් දහස් ගණනක් පාරට පැන්නා. රතිඤ්ඤා පත්තු කළා. සිංදු කිව්වා, නැටුවා, ප්‍රීති වුණා. ඒ විතරක් නෙවෙයි කැවිලි කිරිබත් හද හද, දන්සැල් වගේ, පාරෙ යන එන අයට, රථවාහන වල යන මගීන්ට බලෙන් කන්න දුන්නා. මුළු රටම එකම මහල් ගෙයක් වුණා. හිට්ලර් මරපු වෙලාවෙ ලෝකෙම ප්‍රීතිවුණා වගේ ප්‍රභාකරන්ගෙ මරණය මුළු ලංකාවටම මහා සැහැල්ලුවක්. ඒ ගැන අපේ ජනතාව ප්‍රීතිවීම පුදුමයක් නෙවෙයි. කොටින්ගෙ හිතවත්තු නම් කියනවා කෙනෙකුගෙ මරණෙදි සංතෝෂ වෙන එක මහා අමනුස්ස කමක් කියලා. මෙතන මැරුම් කෑවෙ සාමාන්‍ය ධාර්මික වැසියෙක් නෙවෙයි. රටක් අවුරුදු තිහක් කඳුලෙන් නාවපු මහා අධම, තිරිශ්චීන මිනීමරුවෙක්. ඒ වගේ එකෙක් මැරුණාම ප්‍රීතිවෙන්නෙ නැතුව වෙන මොනව කරන්නද? ඉතින් ප්‍රීති වීම හරිම සාධාරණයි.

ඒ ප්‍රීතිය ඉහවහා ගිය මිනිස්සු එක දවසක් නෙවෙයි සතියකටත් වඩා උත්සව පැවැත්තුවා. තවමත් රථ පෙරහැරවල් යනවා. උත්සව පවත්වනවා. වැඩේ දිගටම යන පාටයි. අපේ අයගෙ හැටි එහෙමයි. මේ සේරම අතරෙ තවත් දෙයක් ගැන අපේ ජනතාවට සහ රජයට මතක් කරන්න ඕනය කියලා මට හිතුණා. ඒ තමයි මේ යුද්ධය අහවර කිරීමත් එක්ක අපේ රජයෙ සහ ජනතාවගෙ කර උඩට වැටිච්ච මහා බර සහ මහා වගකීම. ඒ නිසා ඔය ප්‍රීතිවුණා ඇති ලොකු මස්සිනා. දැන් ඉන් එහාට අපි හිතන්න ඕන.

උතුරෙන් බේරිලා ආපු සරණාගත ජනයා ලක්ෂ තුනක් අද කඳවුරු වල කූඩාරම් වල ඉන්නවා. හැමදාම ඒ මිනිස්සු එහෙම තියාගන ඉන්න බෑ. ඒ පිරිසට කන්න දෙන්නම මාසෙකට ඩොලර් මිලියන 5 ක් වියදම් වෙනවා. එතකොට කොච්චර කාලයක් එහෙම කරන්න අපට හයිය තියනවද? කොහේ තියන සල්ලිද? අපට ණය දෙන්නෙ නැති කතාවකුත් කියනවා. එහෙම කියලා බැහැ. ඒ වියදම කොහොම හරි හොයාගන්න වෙනවා. උතුරෙ ඒ පැනලා ආපු මිනිස්සුන්ගෙ වාසස්ථාන හදල ඒ අය ආපහු පදිංචිකරවන්න, ඒ අය පිළිවෙලක් වෙනකල් ඔවුන්ගෙ අවශ්‍යතා පිරිමහන්න, මේ හැම දේටම සල්ලි ඕන. කෝ සල්ලි?

ඒ පාර ඔය මිනිස්සු ටික කෑම්ප්වල එක ගුලියට ඉඳලා ලෙඩ වෙනවා. අතීසාරෙ, පාචනේ, කොළරාව, ඩෙංගු, මැලේරියාව ඔය ආදී වසංගත ඔක්කොම කඩාපාත් වෙන්න පුළුවනි. ඒවයින් මිනිස්සු සිය ගණන් මැරෙන්න පටන් ගන්න කොට ප්‍රභාකරන් ඇතුළු කොටි ටික විනාස කරලා අපි පෙන්නපු විජයග්‍රහණය අනික් පැත්ත හැරෙනවා. ඒපාර මුළු ලෝකෙම ලංකාවට බනින්න පටන්ගන්නවා. අපේ හතුරො බලාගෙන ඉන්නෙ අපිට වරදින්නෙ කොයි වෙලාවෙද කියලා. ලෝකෙ පුරාම ඉන්න දෙමළ ඩයස්පෝරාව ලංකාවෙ ඉන්න ඔය සරණාගතයින්ටම කියලා කියවාවි මීට වැඩිය කොච්චර හොඳද අපේ ප්‍රභාකරන් උත්තමයා හිටියා නම් කියලා. එන් ජී ඕ කාරයො බලං ඉන්නෙ ලංකාවට රිංගන්න චාන්ස් එකක් එනකල්. මේ කරදර අස්සෙ උන් රිංගාවි. ලංකාවෙ තත්වෙ විකෘති කරලා ලෝකෙට පෙන්නාවී

මේ සේරම අස්සෙ තවමත් හැංගිලා තියන දෙමළ ත්‍රස්තවාදයෙ පිළිකාව ආයිත් හොරෙන් ක්‍රියාත්මක වෙන්න පටන් ගනීවි. එතකොට රජයට ආයිත් යුද්ධයක් කරන්න වෙනවා.

ඒ මදිවට ලංකාවෙ විරුද්ධ පක්ෂය බලාගෙන ඉන්නෙ ආණ්ඩුව කන්න. හමුදාවෙන් කිලිනොච්චිය ඇල්ලුවෙ නැත කියලා තවමත් කියන අය ඒ පක්ෂයෙ ඉන්නවා. ඒ ගොල්ල තමයි ඉස්සරහට පනින්නෙ, මහින්ද රජය මෙන්න යසට හිටපු උතුරේ අසරණයා අඩගහං ඇවිත් අතරමං කළා කියලා. ඔය වගේ දහසක් දේවල් ඉස්සරහට එන්න පුළුවනි.

ඒ නිසා කෑගැහුවා, කොඩි වැනුවා, කිරිබත් කෑවා දැන් ඇති. පැවරී ඇති වගකීම සුළු පටු වගකීමක් නොවන බව දැන්වත් තේරුම් අරගෙන ඒ ඉදිරි ප්‍රශ්න විසඳන විදියකට ක්‍රියා කරනවා නම් මේ ලැබූ ජයග්‍රහණය දීර්ඝ කාලයක් පවතීවි කියලා මම හිතනවා. එච්චරයි මට කියන්න තියෙන්නෙ.

♦ වෙලේගෙදර රාළ London